අනුරාධපුර දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 42 - 2023

------------------------------------------------------------------------

**1. විගණන මතය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 42 හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2023 වර්ෂයට අදාළව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන කාරක සභා 42 ක් සඳහා නිකුත් කර තිබුණු විගණන වාර්තා 42 හි කාරක සභා 41 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීමද, එක් කාරක සභාවක මතය ව්‍යාවනය කිරීමද සිදු කර ඇති අතර, ඒ සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝශයන් පහත දැක්වේ.

**1.1 මූල්‍ය ප්‍රකාශන**

**1.1.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 41 ක් වෙත ලැබී තිබුණු රු.23,790 ක් වූ ජංගම නොවන වත්කම් 04 ක්, කොම්පෝස්ට් හලන යන්ත්‍ර / කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර, පැල සිටුවීමේ යන්ත්‍ර 12 ක් සඳහා ලැබී තිබුණු තැටි 8000 ක්, 2023 වර්ෂයේ ලැබුණු රූපවාහිනි යන්ත්‍රය යන අයිතමවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රවල වටිනාකම දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබා ගෙන ගිණුම්ගත කරන බව | ගොවිජන සේවා කාරක සභාව සතු යන්ත්‍ර සහ උපකරණ වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කාරක සභා 09 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව එකතුව රු.674,587 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව | ස්ථාවර තැන්පතු පොලී ආදායම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 ක එකතුව රු.182,688 ක් වූ කල් ඉකුත් වූ එළවළු බීජ හා පොස්පේට් පොහොර තොගයක් ජංගම වත්කම් යටතේ දක්වා තිබීමෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව | තොග වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 07 ක එකතුව රු.2,254,693 ක් වූ ජංගම නොවන වත්කම් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලට ගෙන තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ජංගම නොවන වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව කාරක සභා 03 ක එකතු වටිනාකම රු.622,065 ක් වූ ලැබිය යුතු ගොවි බැංකු ලාභාංශ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල ආදායමක් ලෙස හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ලැබිය යුතු වත්කමක් ලෙස ද දක්වා නොතිබුණි. | ඉදිරියේදී ගොවි බැංකු ලාභාංශ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | වර්ෂයට අදාළ සියලුම ආදායම් වියදම් මූල්‍ය කාර්සාධන ප්‍රකාශයට ගත යුතු අතර, ජංගම වත්කම් ද නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතුය. |
| (ඊ) | කාරක සභා 07 ක මෘදුකාංග සඳහා ගෙවා ඇති එකතුව රු.156,786 ක් වූ මුදල වර්ෂයට අදාළ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන වියදම් හා අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ගොවිජන සේවා කාරක සභා 03 ක ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු.363,635 ක පොහොර පරිහරණ වියදම් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස දැක්වීමෙන් අතිරික්තය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයෙන් මෙම වියදම් ප්‍රතිපූර්ණය වන බැවින් ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත යුතුය. |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා 02 ක වාර්ෂික ක්ෂය වෙන් කිරීම එකතුව රු.1,943,286 ක වටිනාකම ජංගම වගකීම් යටතේ දක්වා තිබීමෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් හා වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | ආඩියාගල ගොවිජන බැංකුව විසින් ගිණුම්කරණ මෘදුකාංග සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.194,205 ක වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම් ගත නොකර එම වටිනාකම සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඒ) | නෑගම්පහ ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල රු.19,388,271 ක් වුවත්, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට නොගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුළු ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලැබී නැත. | සමුච්චිත අරමුදල් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගැලපිය යුතුය. |
| (ඔ) | පදවි පරාක්‍රමපුර ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළ බැංකු පොලී ආදායම රු.1,927,440 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.2,523,941 ක් ලෙස රු.596,501 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | බැංකු පොලී ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | පේමඩුව ගොවිජන සේවා කාරක සභාවේ පිළිවෙලින් රු.2,017,341 ක් සහ රු.4,091,962 ක් වූ යූරියා සහ එම්.ඕ.පී. සහනාධාර පොහොර තොග ශේෂ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගෙන නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | තොග වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගත යුතුය. |
| (ක) | කල්ලංචිය ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ දී ගෙවා නිරවුල් කර තිබුණු එකතුව රු.245,000 ක් වූ ට්‍රැක්ටර් වාරික මුදල් සහ ජල උස මාපක සවි කිරීමේ වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබීමෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ලෙජර් ගිණුම් නිවැරදිව යාවත්කාලීන කිරීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | මුරියාකඩවල ගොවිජන සේවා කාරක සභාවේ ගෙවිය යුතු ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ වාරික රු.400,000 ක් නිරවුල් කිරීමෙන් තොරව ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. | රජය රු.475,000 කට වෙන්දේසි කර ඇති නමුත් මේ දක්වා වගකීමෙන් නිදහස් කර ඉතිරි මුදල කමිටුව වෙත භාරදී නැත. | ජංගම නොවන වගකීම් නිසිලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| ( ච) | කැබිතිගොල්ලෑව ගොවිජන කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.3,017,966 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,648,945 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.1,630,979 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලැබී නැත. | ස්ථාවර තැන්පතු පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ජ) | ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළ දී දරන ලද රු.1,948,765 ක ප්‍රාග්ධන වැය සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | අත්වැරදීමකින් සිදුවූවකි. | ප්‍රාග්ධන හා අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ට) | කැබිතිගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ පොහොර වලට අදාළ දළ ලාභය නිවැරදිව ගණනය නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.153,676 ක් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | අත්වැරදීමකින් සිදුවූවකි. නිවැරදි කිරීමට කටයුතු කරන බව | විකුණුම්වලට අදාළ දළ ලාභය නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඩ) | කැබිතිගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂය තුළදී රු.161,484 ක වියදමක් දරා පොහොර ගබඩාව වෙත පිවිසෙන ගේට්ටුව අලුත්වැඩියා කර තිබුණ ද, එම වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | අදාළ අලුත්වැඩියා වියදම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත යුතුය. |
| (න) | ගම්බිරිගස්වැව ගොවිජන සේවා කාරක සභාවේ ප්‍රවර්ථන වර්ෂය සඳහා පිළියෙල කළ වාණිජ පොහොර වෙළඳ ගිණුම අනුව වැඩි මිල පොහොර අවසන් තොග රු.3,926,242 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අවසන් තොග ශේෂ නිවැරදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශන තුළ හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ප) | ගිණුම් වර්ෂය අවසන් වීමට පෙර නිරවුල් කළ යුතු වුවද, රනෝරාව ගොවිජන සේවා කාරක සභාවේ දීර්ඝ කාලයක් සිට පැවත එන රු.641,090 ක් වටිනා අවිනිශ්චිත ගිණුම් ශේෂ 03 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්තුමාගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුම් ශේෂ වර්ෂය තුළ නිරවුල් කළ යුතුය. |

## 1.1.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පොහොර අයිතම 03 කට අදාළව රු.441,509 ක ශේෂයක් තොග සත්‍යාපන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02 ක හා ගොවි බැංකු මූල්‍ය ප්‍රකාශන 2හි බැංකුව විසින් ගෙවිය යුතු ලාභාංශ වටිනාකම කාරක සභා පොත් අනුව හා ලැබිය යුතු ගොවිබැංකු ලාභාංශය අතර රු.314,444 ක නොසැසඳීමක් විය. | නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | එප්පාවල ගොවිජන සේවා කාරක සභාවේ වැඩි මිල පොහොර විකුණුම් ලෙජර් ගිණුමට අනුව විකුණුම් ආදායම හා වෙළඳ ගිණුම විකුණුම් ආදායම අතර රු.928,000 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කළ බව දන්වා සිටිමි. | නිවැරදි ශේෂය හඳුනාගෙන ගිණුම්වලට ගැලපීම් කළ යුතුය. |
| (ඈ) | පලාගල ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළ ආඩියාගල ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් හා ගොවි බැංකුවෙන් ලැබිය යුතු ශේෂ ලෙස රු.1,488,800 ක් දක්වා තිබුණ ද ආඩියාගල ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළ එම ශේෂ දක්වා නොතිබීමෙන් රු.1,488,800 ක නොසැසඳීමක් විය. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු කර ඇති අතර, එය අවසන් වීමෙන් අනතුරුව අවශ්‍ය ඉදිරි ගැලපීම් සිදු කළ හැක. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පදවිපරාක්‍රමපුර ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළ පවතින ප්‍රමාණාත්මක තොග ගිණුම හා වෙළඳ ගිණුම අතර අයිතම 04 ක රු.645,084 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඇතාකඩ ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශනයෙහි සහනාධාර පොහොර සඳහා ඉදිරිපත් කර ඇති වෙළඳ ගිණුමට අනුව පෙර වර්ෂයෙහි අවසාන දිනට සහනාධාර පොහොර තොගයෙහි වටිනාකම හා 2023 වර්ෂයේ ආරම්භක තොගයෙහි වටිනාකම අතර රු.2,690,939 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.1.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 28 කට අදාළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.17,819,896 ක ජංගම නොවන වත්කම් විෂයයන් 05ක්, රු.143,877,199 ක ජංගම වත්කම් විෂයයන් 25 ක්, රු.2,359,992 ක ජංගම නොවන වගකීම් විෂයයන් 02 ක් සහ රු.96,728,127 ක ජංගම වගකීම් විෂයයන් 22 ක් ස්ථාවර වත්කම් ලේඛනය, අයිතිය තහවුරු කිරීමේ ලිපි, තොග ලේඛන, ශේෂ සනාථන ලිපි සහ කාල විශ්ලේෂණ වාර්තා නොමැති වීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සතොයක්ෂණය කිරීමට නොහැකි විය. | 2024 ගිණුම් වාර්තාවල මෙම අඩුපාඩු සකස් කර නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සටහන්, වාර්තා, ලේඛන ආදිය ඇතුළත් කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව පහත සඳහන් නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත 14 (3) වගන්තිය | ශ්‍රාවස්තිපුර ගොවිජන සේවා කාරක සභාවේ ආරවුල් පවතින කුඹුරුවල අඳ ගොවියන් විසින් ඉඩම් හිමියන්ට ගෙවීම පිණිස කාරක සභාවේ තැන්පත් කර තිබූ රු.1,295,922 ක ඉඩම් හිමි ප්‍රවේණි මුදල් වර්ෂ ගණනාවක සිට කාරක සභා අරමුදලේ රඳවා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 53 (1) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 03 ක 2023 වර්ෂයේ වගා කන්නවලට අදාළව පැවති කෘෂි කාර්මික වැඩසටහනක් විගණනයට ඉදිරිපත් නොවුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 110 | ගොවිජන සේවා කාරක සභා 18 ක් විසින් හානි හා පාඩු සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 156 (5) | ගොවිජන සේවා කාරක සභා 08 ක ලෙජරය, දෛනික මුදල් ලැබීම් ලේඛනය, දෛනික මුදල් ගෙවීම් ලේඛන, තොග පොත්, මුදල් පොත් මකන දියර භාවිතා කර වෙනස්කම් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| iii. | මුදල් රෙගුලාසි 264 | ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද පිළිවෙලින් රු.206,056 ක් හා රු.34,000 ක් වූ ගෙවීම් වවුචර් සඳහා වවුචරයේ සඳහන් මුදල ලබා ගත් බවට ආදායකයාගේ අත්සන් හෝ ඒ සඳහා ගෙවීම් කළ බවට වවුචර් සමඟ කිසිඳු ලිඛිත සාක්ෂියක් නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| iv. | මුදල් රෙගුලාසි 316 | රජයේ සියලුම මුදල් සේප්පුවක, ආරක්ෂා පෙට්ටියක, ආරක්ෂා කාමරයක වැනි ආරක්ෂිත ස්ථානයක තැබිය යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 09 ක මුදල් එවැනි ආරක්ෂිත ස්ථානයක තබා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| v. | මුදල් රෙගුලාසි 342(5) | ගොවිජන සේවා කාරක සභා 03 ක භාවිතා කර අවසන් වූ කුවිතාන්සි පොත් නැවත භාර ගැනීමෙන් තොරව නැවත නිකුත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| vi. | මුදල් රෙගුලාසි 454 (2) | ගොවිජන සේවා කාරක සභා 02 ක විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | කෝන්වැව - විදුලි උපකරණ ලේඛනයක් පවත්වා ගෙන යනු ලබන අතර, එය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව පරංගියාවාඩිය - පිළිතුරු ලබා දී නැත. | - එම - |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 21.2 ඡේදය | විධායක ලේකම්වරයා විසින් අඩු වශයෙන් දෙසතියකට වරක්වත් තොග පොත් පරීක්ෂා කර එහි ඇති කරුණු නිවැරදි බව සැහීමකට පත් වී තොග පොත් අත්සන් කළ යුතු වුවත් කාරක සභා 15 ක් විසින් ඊට අනුකූලව අධීක්ෂණ කටයුතු ඉටු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| (ඉ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ | | | |
| | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | කාරක සභා 12 ක අදාළ වර්ෂය තුළ කාමර කුලී අය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.894,329 ක හිඟ ශේෂයක් අයකර ගත යුතුව පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2016 මාර්තු 21 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛ | ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් 2024 අප්‍රේල් 26 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පලාගල -භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොමැති වුවත්, පොදු 44 හා පොදු 66 ආකෘති සම්පූර්ණ කර ඇත.<br>පදවි පරාක්‍රමපුර සහ ගම්බිරිගස්වැව ගොවිජන සේවා මධ්‍යස්ථානය නිවැරදි කිරීමට කටයුතු කරන බව | - එම - |
| (උ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 12/2018 (සංශෝධිත) | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය සහකාර කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව කාරක සභා 02 ක් විසින් රු.804,202 ක් හා රු.4,610,262 ක ගෙවීමක් සී/ස කොමර්ෂල් පොහොර සමාගම වෙත සිදු කර තිබුණි. | පලාගල - ගෙවීම අනුමැතියට ඉදිරිපත් කළ ද අනුමැතිය ලැබී නැත.<br><br>තන්තිරිමලේ - අනුමැතිය ලද වවුචරය අස්ථාන ගත වී ඇති බැවින් නව වවුචරයක් අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | - එම - |

**2. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 42 සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.61,641,523 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,029,369 ක් විය. සමාලෝචිත වර්ෂයේ ගොවිජන බැංකු 41 ක මූල්‍ය ප්‍රතිඵලයේ එකතුව රු.20,166,421 ක අතිරික්තයක් ද එක් බැංකුවද රු.21,291 ක ඌනතාවයක්ද වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,977,580 ක් විය. මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයන්ට කමිටු පොහොර ආදායම් සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 31 ක් විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටි ඉඩම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 ක කාබනික දියර පොහොර ලීටර් 2636 ක්, ජෛව දියර පොහොර කිලෝග්‍රෑම් 810 ක්, ජෛව දියර පොහොර ලීටර් 1797 ක්, විශේෂ පොහොර කිලෝග්‍රෑම් 650 ක් කාබනික පොහොර කිලෝග්‍රෑම් 1200 ක් සහ වටිනාකම රු.37,050 ක් වූ දියර පොහොර තොගයක් වටිනාකම සඳහන් නොවූ කාබනික පොහොර පැකට් 1290 ක්, රු.37,050 ක් වටිනා කාබනික දියර පොහොර වර්ග 02 ක් කල් ඉකුත් වීමට පෙර නිසි පරිදි භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවීන් විසින් මෙම පොහොර ලබා නොගත් බැවින් අදාළ තොග ගබඩාවේ ඉතිරි වී පවතින බව හා නැවත සමාගම වෙත භාර ගන්නා ලෙස සමාගම දැනුවත් කර ඇති බව | කල් ඉකුත් වීමට පෙර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03 ක ඇඹිලි සලකුණු යන්ත්‍ර අක්‍රීය වීම මත භාවිතයෙන් බැහැර කර තිබුණු අතර, අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අක්‍රීය වී ඇති ඇඹිලි සලකුණු යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට | අක්‍රීය ඇඹිලි සලකුණු යන්ත්‍ර ඉක්මනින් අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කහටගස්දිගිලිය ගොවිජන සේවා කාරක සභාව සඳහා ලබාදී තිබුණු පොහොර (ERP) කිලෝග්‍රෑම් 7050 ක්, ප්‍රමාණය ගණනය නොකල කාබනික පොහොර/කාබනික දියර පොහොර තොගයක් වසර කිහිපයක සිට කාරක සභා ගබඩාවේ නිශ්කාර්යව විනාශ වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | ERP පොහොර කිලෝග්‍රෑම් 50 බැගින් වූ මිටි 81 ක් කල් ඉකුත් වීම නිසා ඉවත් කිරීමට අනුමැතියට යොමු කර ඇති බව සහ කාබනික පොහොර, කාබනික දියර පොහොර කල් ඉකුත් වීම නිසා ඉවත් කිරීමට කටයුතු කරන බව | පොහොර වර්ග කල් ඉකුත් වීමට පෙර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඉ) | කපුගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ ජල උසමාපක සවි කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.100,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂයේ දී නිරවුල් කරන බව | ගෙවිය යුතු වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රාවස්තිපුර හා ඇලයායපත්තුව ගොවිජන සේවා කාරක සභාව විසින් බල ප්‍රදේශයේ එක් වැවක රොන්මඩ ඉවත් කිරීම සඳහා තැන්පතු මුදල් ලෙස පිළිවෙලින් ලබා ගත් රු.680,000 ක මුදලක් හා රු.336,000 ක මුදලක් ගිණුම්වලට ඇතුළත් කිරීම හැර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 05/2021 අංක දරන හා 2021 මැයි 12 දිනැති සුළු වාරිමාර්ග වැව්වල රොන්මඩ ඉවත් කිරීමට අවසර ලබාදීමේ චක්‍රලේඛයේ අනෙකුත් විධිවිධාන ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ මුදල ලාභයක් සේ කාරක සභාවට ලබාගැනීමට කටයුතු කරන අතර, ඉදිරියේ දී රොන්මඩ ඉවත්කිරීම සඳහා ලැබෙන මුදල් සම්බන්ධයෙන් නිවැරදිව ගිවිසුම්ගත ආකාරයට ක්‍රියා කිරීමට කටයුතු කරන බව ඇලයාපත්තුව - චක්‍රලේඛ උපදෙස් පරිදි අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | ශ්‍රාවස්තිපුර ගොවිජන සංවර්ධන කාරක සභාව විසින් 2005/2006 මහ කන්නයේ වී මිලට ගැනීම් සඳහා පෞද්ගලික ආයතනයට ලබා දී තිබූ ණය මුදලකින් අය විය යුතුව පැවති රු.1,025,642 ක මුදලක් රු.30,000 බැගින් වූ ණය වාරික වලින් ගෙවන ලෙස අනුරාධපුරය මහ අධිකරණය 2012 වර්ෂයේ නියෝග කර තිබූ මුත්, එම මුදල් අය කරගත් බවට කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය. | අදාළ ණය මුදල අයකර ගැනීමට කටයුතු කරන බව | ණය මුදල අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ගොවිජන සේවා බල ප්‍රදේශයේ පුරන් කුඹුරු හැකිතාක්දුරට අවම කර ගැනීමට ගොවිජන සේවා කාරක සභාව උත්සහ කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 02 ක බල ප්‍රදේශය තුළ අක්කර 101.1 ක පමණ පුරන් කුඹුරු පැවතුණි. | කුඹුරු පුරන් වීමට හේතු සොයා බලා ඉදිරියේ දී එම පුරන් කුඹුරු අස්වැද්දීමට කටයුතු කරන බව | පුරන් කුඹුරු ප්‍රමාණය හැකිතාක් දුරට අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | කල්ලංචිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හිටපු ප්‍රාදේශීය නිලධාරියෙකුගෙන් අයකර ගත යුතුව පවතින රු.327,110 ක තොග ඌනතා වටිනාකම හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක කලක සිට පැවත එන රු.77,995 ක තොග ඌනතාවය හඳුනාගෙන අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | තොග ඌනතා වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය. |
| (ඒ) | ගොවිජන සේවා කාරක සභා 03 ක හඳුනාගෙන තිබූ එකතුව රු.1,265,740 ක අත ඉතිරි මුදල් ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් විගණනයක් සිදුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මූලික පරීක්ෂණ කඩිනමින් පැවැත්විය යුතුය. |
| (ඔ) | මුරියාකඩවල ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත කාබනික පොහොර වැඩසටහනට අදාළව නොමිලේ ගොවීන් වෙත බෙදා දීම සඳහා ඊ.ආර්.පී. පොහොර කිලෝග්‍රෑම් 50 මිටි 67 ක් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත 2022 ජනවාරි 12 දින ලැබී තිබුණු අතර, එම පොහොර තොගය විගණිත දින වූ 2024 පෙබරවාරි 07 දින වන විටත් ගබඩාව තුළම පැවතුණි. | මෙම පොහොර ප්‍රමාණය ගොවීන් වෙත බෙදා දීමට කටයුතු කරන බව | පොහොර ගොවීන් වෙත බෙදා දීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඕ) | මිහින්තලේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට අදාළව 2013 වර්ෂයේ දී සිදු කළ මුදල් රෙගුලාසි 104 (අ) පරීක්ෂණයට අනුව නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය කර ගත යුතු රු.2,858,551 ක මුදලින් 2023 ඔක්තෝබර් 31 දිනට තවදුරටත් රු.1,958,551 ක මුදලින් අයකර ගත යුතුව පැවතුණි. | මීට අදාළ පුද්ගලයන්ට මුදල් ගෙවන ලෙස දන්වා තිබුණ ද මුදල් අය කර ගත නොහැකි වීමෙන් ප්‍රධාන කාර්යාලයේ උපදෙස් මත ක්‍රියා කිරීමට කටයුතු කරන බව | අදාළ මුදල කඩිනමින් අය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | මුරියාකඩවල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හිටපු ප්‍රාදේශීය සංවර්ධන නිළධාරියෙකු විසින් 2011 අගෝස්තු 12 දින පෞද්ගලික ස්ථාවර ගිණුමක් වෙත පොහොර ආයෝජන ගිණුමෙන් රු.450,000 ක වටිනාකමැති චෙක්පතක් බැර කිරීම හේතුවෙන් එම මුදල සහ ඊට අදාල පොලිය වන රු.478,684 සමඟ රු.928,684 ක මුදලක් අයකර ගත යුතුව පැවතුණි. | නීති මඟින් එම මුදල අයකර ගැනීමට කටයුතු යොදා ඇති බව | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මඟින් අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ග) | පලුගස්වැව ගොවිජන සේවා කාරක සභාවේ පැරණි තොග පොත අස්ථාන ගතවීමෙන් අනතුරුව පිළියෙල කර තිබුණු නව තොග පොතෙහි 2023 ජනවාරි 16 දිනට ආරම්භක ශේෂයෙහි විකුණුම් වටිනාකම රු.1,199,600 ක් වූ යූරියා කිලෝග්‍රෑම් 5998 ක ඌන තොග සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ගොවිජන සේවා කාරක සභාව සතු තොග ලේඛන ආරක්ෂිතව තබා ගැනීමට කටයුතු කළ යුතු අතර, තොග ලේඛන විධිමත්ව යාවත්කාලීන කළ යුතුවේ. තවද ඌන තොගයක් ඇති වීමට හේතු විධිමත් පරීක්ෂණයක් මඟින් හඳුනාගත යුතුය. |
| (ච) | යකල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හිටපු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකුගෙන් 2014/15 මහ කන්නයේ මධ්‍යස්ථානය වෙත වැඩි මිල පොහොර ලබාගැනීම වෙනුවෙන් අයකර ගත යුතුව පැවති රු.736,800 ක මුදල සමාලෝචිත වර්ෂයේ දී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට මු.රෙ. 104 පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවතින බව | හිඟ ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 16 ක දිර්ඝ කාලයක් තිස්සේ දිගින් දිගටම නිරවුල් නොවී පවතින වටිනාකම රු.26,344,644 ක්වූ ලැබිය යුතු ගිණුම් 53 ක් සහ එකතුව රු.13,018,377 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 55 ක් නිරවුල් කර ගැනීමට | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් මත මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව | අදාළ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2019 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කැබිතිගොල්ලෑව හා මැදවච්චිය ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී තිබූ ජල උස මාපක 28 ක් විගණිත දිනය වූ 2024 මැයි 10 දින වන විටත් සවි කිරීමට හෝ ගොවි සංවිධාන වෙත භාර දීමට කටයුතු නොකර ගබඩා පරිශ්‍රයේ පැවතුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 39 ක් සඳහා 2021 දෙසැම්බර් මස ලැබී තිබුණු කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍රය /හලන යන්ත්‍ර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍රය /හලන යන්ත්‍රය ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය ට්‍රැක්ටර් රථයක් මධ්‍යස්ථානය සතු නොවන බව | වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 ක් සතු පැල කුටි අලෙවි සැල හා කාබනික පොහොර ගෘහ වසර කිහිපයක සිට නිශ්කාර්යව පැවතුණි. | ඉදිරියේ දී එම කුටිය වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු සිදු කරන බව | - එම - |
| (ඇ) | රත්මල්ගහවැව ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත 2022 මාර්තු 09 දින ලැබී තිබූ ගොයම් පැල සිටුවීමේ යන්ත්‍ර 04 ක් හා ඒ සඳහා ලැබී තිබුණු Rice Seeding Tray 8000 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍ර භාවිතා කිරීමට ගොවීන්ගේ අකමැත්ත නිසා මෙතක් භාවිතා කර නොමැත. | - එම - |
| (ඈ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක් වෙත 2021 හා 2022 වර්ෂවල දේශගුණික සුහුරු ව්‍යාපෘතිය මඟින් ලැබී තිබුණු බීජ සිටුවන යන්ත්‍ර 02 ක්, තනකොළ ගලවන යන්ත්‍ර 04 ක්, ගොයම් සිටුවන යන්ත්‍ර 05 ක් සහ ගොයම් කැපීමේ යන්ත්‍ර 02 ක් නිශ්කාර්යව පැවතුණි. | මෙම බලප්‍රදේශය සඳහා මෙම යන්ත්‍ර උචිත නොවන බව දන්වා අදාළ යන්ත්‍ර වෙනත් මධ්‍යස්ථානයකට ලබාදෙන ලෙස දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලිඛිතව දන්වා ඇති බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2021 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් රු.2,202,965 ක වියදමක් දරා පරාක්‍රමපුර ගොවිජන සේවා කාරක සභාවේ ඉදිකර තිබූ හෙළබොජුන් අලවිසැල භාවිතයට ගැනීමට කටයුතු නොකිරීමෙන් නිෂ්කාර්යව පැවතුණි. | හෙළ බොජුන්හල වටා වැටක් ඉදිකර වෙන්කිරීමේ කටයුතු සිදු කිරීමට පවතින අතර ඉදිරි මාස කිහිපය තුළ එම කටයුතු අවසන් කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | - එම - |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් තුළ බිම් තරාදියක් 02 ක්, අත්ට්‍රැක්ටර් 04 ක්, පැල සිටුවන යන්ත්‍ර 03 ක් සහ අස්වනු නෙලීමේ යන්ත්‍ර 04 ක්, වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේ දී භාවිතයට ගැනීමට කටයුතු කරන බව | වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | SAAP ව්‍යාපෘතිය යටතේ ඇලයාපත්තුව ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමියේ වාහන නැවතුම් ගරාජයක් ඉදිකර තිබූ මුත්, එම ගොවිජන සේවා කාරක සභාව භාරයේ කිසිදු වාහනයක් නොමැතිවීමෙන් අදාළ ව්‍යාපෘතිය නිෂ්කාර්ය වී තිබුණි. | අදාළ ව්‍යාපෘතිය මඟින් ඉදිරියේ දී උපකරණ ලබා දෙන බැවින් ඒවා ගාල් කිරීම සඳහා මෙම ගොඩනැගිල්ල සකසා ඇති බව | විධිමත් ඇගයීමක් සිදු කර ව්‍යාපෘතිවල අවශ්‍යතාවය හඳුනාගත යුතුය. |

**4. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ගොවිජන සේවා කාරක සභා 17 කට අදාල වසම් 282 ක් අතරින් වසම් 115 ක් මගින් කිසිදු වගා ණයක් නිකුත් කර නොතිබුණු අතර, වසම් 244 ක් මගින් කිසිදු ව්‍යාපෘති ණයක් නිකුත් කර නොතිබුණි. | නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව හා කෘ.ප.නි.ස. නිලධාරීන් දැනුවත් කරන බවත් ලබා දෙන ණය ප්‍රමාණවත් නොවන බව ජනතාව පවසන බව | ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා නිලධාරීන් ක්‍රියා කළ යුතුය. |
| (ආ) | වසම් තුළ කුඩා කණ්ඩායම් පිහිටුවීම හා ඔවුන් සක්‍රීය ලෙස ගොවිජන බැංකුව සමඟ දායක කර ගැනීම වසම් භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීගේ වගකීමක් වුවද, ගොවිජන කාරක සභා බල ප්‍රදේශ 24 ක එකතුව 100,071 ක්වූ ගොවි පවුල් වලින් ගොවිජන බැංකු සමඟ සම්බන්ධ වී සිටින කුඩා කාණ්ඩායම් ගණන 3360 වැනි අවම ප්‍රමාණයක් විය. | එම කුඩා කණ්ඩායම් ගිණුම් ප්‍රමාණය වර්ධනය කර ගැනීමට කටයුතු කරන බව | වසම තුළ කුඩා කණ්ඩායම් පිහිටුවීමට හා ඔවුන් සක්‍රීය ලෙස ගොවිජන බැංකුව සමඟ දායක කර ගැනීමට කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරීන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන බැංකු 05 ක සාමාජික ණය මුදල් අයකර ගැනීම සඳහා 2004 හා 2007 වර්ෂවල මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩු විභාගවලට අදාළව අධිකරණය මගින් අයකර ගෙන තිබූ රු.1,085,264 ක ණය මුදල් විගණිත දින වන විටත් ගොවිජන බැංකුව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ මුදල් අධිකරණයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවි බැංකු 06 ක අසම්පූර්ණ ණය අයදුම්පත් 117 කට අදාළව එකතුව රු.6,945,000 ක ණය මුදල් නිකුත් කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ණය ලබා දීම් විධිමත්ව සිදු කළ යුතු බව |
| (ඉ) | ගොවිජන බැංකු 04 ක 2015/2016, 2019/2020 සහ 2020/2021 වර්ෂවල නිකුත් කර තිබුණු විශේෂ බඩ ඉරිඟු ණය මුදලින් ගොවීන් 130 දෙනෙකුගෙන් රු.6,071,541 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතුව පැවතුණි. | මෙම ණයකරුවන් ගොවිජන විනිශ්චය සභාවට යොමුකර ඇත. | හිඟ ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගම්බිරිගස්වැව ගොවිජන බැංකුවේ 2017 වර්ෂයේ ලබා දී ඇති සාර ලංකා ව්‍යාපෘති ණය රු.500,000 කින් රු.480,722 ක ණය ශේෂයක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය අය කර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (උ) | ගොවිජන බැංකු 03 ක කෘෂිකාර්මික ණය, වී අස්වනු නෙලීමේ ණය, ව්‍යවසායක ණය නිකුත් කිරීමට අදාළව ගොවීන් 69 දෙනෙකුගෙන් එකතුව රු.3,514,673 ක කල්පසු වූ හිඟ ණය මුදලක් අයකර ගත යුතුව පැවතුණි. | සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන බව | - එම - |
| (ඌ) | ගොවිජන බැංකු 08 ක් විසින් ගොවීන් වෙත නිකුත් කර තිබූ ණය මුදල් වලින් 2023 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමෙන් තොරව කල්පසු වී තිබූ ණය ප්‍රමාණය රු.12,543,678 ක් විය. | කල් පසු වූ හිඟ ණය අය කර ගැනීම සඳහා ගොවිජන විනිශ්චය සභාවට හා අධිකරණයට යොමු කර ඇත | - එම - |

| | | | |
|---|---|---|---|
| (එ) | සාලියපුර ගොවිජන කාරක සභා බල ප්‍රදේශයේ මුළු ගොවි පවුල් ගණන 3870 ක් පමණ වුවද, ඉන් ගොවි පවුල් 2041 ක් පමණක් ගොවි බැංකු කටයුතු සඳහා සම්බන්ධ වී ඇති අතර ගොවි පවුල් 1829 ක් හෙවත් සියයට 47 ක් පමණ තවදුරටත් ගොවි බැංකු කටයුතු සඳහා ආකර්ශනය කර ගැනීමට ගොවි බැංකුව අපොහොසත්ව තිබුණි.. | ඉදිරියේ දී ගොවි බැංකුව වෙත සම්බන්ධ නොවූ ගොවි පවුල් සම්බන්ධ කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | බැංකු කටයුතු ව්‍යාප්ත කිරීමට විධිමත් පියවර ගත යුතුය. |